**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2017 අප්‍රේල්

සංස්කෘත

SANE 101 සංස්කෘත ව්‍යාකරණ

කාලය - පැය තුනයි.

**ප්‍රශ්න පහකට (05) පමණක්** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්නපත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව අටකි. එක් පිළිතුරක් සඳහා ලකුණු විස්සක් හිමි වේ.

---

1. හලන්ත සහ ස්වරාන්ත නාමපද වරනැගීම් අතරින් හලන්ත නාමපද වරනැගීම වඩා පහසු ය. නිදසුන් දෙමින් විචාරයක යෙදෙන්න. (ලකුණු 20)

2. අර්ථ උකහා ගැනීමේ දී බහුව්‍රීහි සමාසය අනෙකුත් සමාසයන්ට වඩා වෙනස් වන්නේ කෙසේ දැ යි සනිදර්ශන ව විමසන්න. (ලකුණු 20)

3. අතීත සහ වර්තමාන කෘදන්ත සාධනයේ දී උපකාරී වන ප්‍රත්‍ය මොනවාදැ යි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

4. කාලත්‍රයට අයත් නොවන ලකාර මොනවාදැ යි හඳුන්වා දී ඒවායේ භාවිතය පිළිබඳ නිදසුන් සහිත රචනයක් ලියන්න. (ලකුණු 20)

5. වරනැගීමේ දී නාමමූලයට සිදු වන වෙනස් අනුව දුර්වල, මධ්‍යම, සහ ශක්තිමත් වශයෙන් නාමමූල වර්ගීකරණය අපරදිග ඇතැම් සංස්කෘත ව්‍යාකරණඥයන් අතින් සිදුවන්නේ කෙසේ දැ යි සනිදර්ශන ව පහදන්න. (ලකුණු 20)

6. විකරණ යෙදීම කරණ කොට ගෙන ධාතුමූල දශගණයන්ට බෙදී යන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

7. අනුස්වාරය සහ විසර්ගය බාහිර සන්ධිවල දී වෙනස්කම්වලට බඳුන් වන්නේ කෙසේ දැ යි පෙන්වා දෙන්න. (ලකුණු 20)

8. පහත දැක්වෙන මාතෘකා පිළිබඳ නිදසුන් සහිත කෙටි සටහන් ලියන්න. (ලකුණු 20)

   i. අපත්‍යාර්ථ තද්ධිතය
   ii. ලෝප සහ ලෝපශ්
   iii. සාර්වධාතුක ලකාර
   iv. ක්‍රියාමූලයන්හි ද්විත්ව වීම
   v. තුමන්ත රූප සාධනය